

යථාර්ථය පිළිබඳ අකල්පිත වාර්තාවක් වන The God of Small Things, 1997 දී මෑන් බුකර් (The Man Booker) සම්මානයට ද පාත්‍ර විය. එමෙන්ම 2002 ලෙනාන් පදනම විසින් පිරිනමන සංස්කෘතික නිදහස පිළිබඳ සම්මානය, 2004 දී සිඩ්නි සාම සම්මානය සහ 2011 දී ඇගේ විශිෂ්ඨ ලේඛන කලාව සඳහා වන නෝමන් මෙලර් යන සම්මානයන්ගෙන් ද ඇය පිදුම් ලැබුවා ය. නමුත් වරක් සිය The Algebra of Infinite Justice නම් දේශපාලන ලිපි මාලාව වෙනුවෙන් ඇයට පිරිනැමීමට නියමිතව තිබූ ඉන්දියානු සාහිත්‍ය ඇකඩමි ත්‍යාගය රෝයි තමා විසින් ම ප්‍රතික්ෂේප කළාය. ඒ ඇමෙරිකානු යුධවාදී ප්‍රතිපත්ති සහ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්ති අනුගමනය කරන සිය රටෙන් එවැනි සම්මානයක් ඇය බලාපොරොත්තු නොවූ හෙයිනි.

මෙවන් ඍජු ප්‍රතිපත්තිවලින් පරිපූර්ණ වූ නිර්භීත සිල්ලර දෙවඟනක වූ අරුන්දතී රෝයි ලොව පුරා දුගී ජනතාවගේ හද ගැස්ම යි. අසාධාරණයේ වෛරක්කාරිය යි. නිරුවත් දේශපාලන සත්‍යයේ විවේචනය යි.

ගලවා ඉවත දැමුවා යැයි සිතුවත් දුෂ්ඨ බලවේග පසුපස තවමත් හඹා යන සාධාරණත්වයේ සෙවණැල්ල යි.

**ප්‍රභානි සචින්තනා මන්ත්‍රීරත්න**

# හිතකර පරිගණක භාවිතයකට මග

පරිගණකය භාවිතය නිසා අප දැනුවත්ව හෝ නොදැනුවත්ව ම අපගේ ශරීරයට මනසට ඇතිවන ශාරීරික හෝ මානසික පීඩා බොහෝ ය.
මේ අතර
**ඇස් වියළීම, ඇසේ වේදනාව, ගෙල පිටුපස හා මැණික් කටුව ආශ්‍රිත වේදනා**
ඇතිවීම සුලබ තත්වයක් ලෙස දැකිය හැක.

**ව**ර්තමානය වන විට අපගේ තරුණ පරම්පරාව මෙන් ම බොහෝ පිරිසක් පරිගණකය භාවිත කිරීමට හුරු වී සිටිති. නැතහොත් ඒ ආශ්‍රිත රැකියාවක හෝ නිරත වී සිටිය හැක. ඒ තරමටම පරිගණකය (computer or laptop) අපේ ජීවිතයට සමීප වී ඇත.

නමුත් පරිගණකය භාවිතය නිසා අප දැනුවත්ව හෝ නොදැනුවත්ව ම අපගේ ශරීරයට මනසට ඇතිවන ශාරීරික හෝ මානසික පීඩා බොහෝ ය. මේ අතර ඇස් වියළීම, ඇස් වේදනා, ගෙල පිටුපස හා මැණික් කටුව ආශ්‍රිත වේදනා ඇති වීම සුලබ තත්වයක් ලෙස දැකිය හැක. විශේෂයෙන් පරිගණකය දීර්ඝ වෙලාවක් භාවිත කරන පුද්ගලයන් මේ නිසා දැඩි ලෙස පීඩා විඳින අවස්ථා දැක ගත හැකි ය.




ඒ හේතුන් මත Windows සමාගම විසින් "SmartBreak" නම් පරිගණක මෘදුකාංගය (software) හඳුන්වා දී තිබෙන අතර එය පරිගණකය තුළ ස්ථාපිත (install) කිරීම තුළින් පරිගණකය ආශ්‍රිතව දීර්ඝ වෙලාවක් අවිවේකීව වැඩෙහි යෙදෙන ඔබට මේ මෘදුකාංගය මගින් විනාඩි 20 කට වරක් කෙටි විවේකයක අවශ්‍යතාවය සිහි කැඳවීමක් කරයි. එනම් ඔබට Ringing Tone මගින් ඔබට එය දන්වයි. ඊට අමතරව පරිගණකයෙහි Desktop Background තාවකාලික අඳුරු කිරීමකට ලක් කරයි. මෙයින් ඔබගේ ඇසට ඇතිවන විඩාව සමනය කිරීමට උත්සහ දරන අතර ම ඔබට විවේකයක් ගැනීමට සිහිකැඳවීමක් ද සිදු කරයි. මේ මඟින් පරිගණකය භාවිතයෙන් ඔබට ඇතිවන සෞඛ්‍ය ගැටළු අවම කිරීම මෘදුකාංගය සම්පාදකයන්ගේ අරමුණ යි.

ඉතා කුඩා මෘදුකාංගයක් වන මෙය 2.24 mb ක් ප්‍රමාණික වන අතර $ 19.95 මුදලකට මිල දී ගත හැකි සෞඛ්‍යාරක්ෂිත පරිගණක මෘදුකාංගයකි. inchwest.com වෙබ් අඩවියට පිවිසීම මඟින් ඔබට මෙම මෘදුකාංගය පිළිබඳ වැඩිදුර විස්තර ලබාගැනීමට හෝ මිල දී ගැනීමේ හැකියාව ලබා දී ඇති අතර ඊට අමතරව මෙම මෘදුකාංගය ඕනෑම Windows version එකකට භාවිතා කිරීමේ හැකියාව ද සහිත ය.

නැතිවම බැරි පරිගණකය අවම හානියකින් යුතුව භාවිත කිරීමට මෙම මෘදුකාංගය අත්වැලක් සපයනු ඇති අතර සැමට ප්‍රථම ආරක්ෂාකාරී වීම නුවණට හුරු කරුණකි.

**එච්. සජිත් ගයාන්**

